# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம்,கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01 Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) -11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.:
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2021 – 03 - 15

- ප්‍රවෘත්ති නිවේදන -

## බැංකු ණය නොගෙවීම හේතුවෙන් දේපළ වෙන්දේසි කිරීමට පෙර ඒ පිළිබඳ සොයා බැලීමට බලධාරියකු පත් කරන්නැයි අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් උපදෙස්

ණය ගෙවීම පැහැර හැරීම හේතුවෙන් බැංකු මගින් ණයකරුවන්ගේ දේපළ වෙන්දේසි කිරීමට පෙර ඒ පිළිබඳ සොයා බැලීම සඳහා බලධාරියකු පත් කිරීමේ අවශ්‍යතාව ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා අවධාරණය කරයි. අග්‍රාමාත්‍යවරයා පෙන්වා දෙන්නේ වෙන්දේසි කිරීමට හේතුව සහ ණයකරුවාගේ මූල්‍ය ඉතිහාසය පිළිබඳ සොයා බැලීම අත්‍යාවශ්‍ය බවයි. අදාළ බලධාරියාගේ අනුමැතියකින් තොරව දේපොළ වෙන්දේසි කිරීමට නොහැකි වන පරිදි පවතින අණපත් සංශෝධනය කිරීමේ අවශ්‍යතාව මහින්ද රාජපක්ෂ මැතිතුමා පෙන්වා දෙයි. අග්‍රාමාත්‍යතුමා මේ බව කියා සිටියේ කර්මාන්තකරුවන් මුහුණ දී සිටින ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා අද (15) මුදල් අමාත්‍යාංශයේ පැවැති හමුවකට එක්වෙමිනි.

කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතා එහි දී කියා සිටියේ පාස්කු ප්‍රහාරය සහ කොවිඩ් වසංගතය හමුවේ පීඩාවට පත් කර්මාන්ත වෙනුවෙන් රජය විවිධ සහන ලබා දීමට කටයුතු කළ ද ඇතැම් කර්මාන්තකරුවන් ඔවුන්ගේ ක්ෂේත්‍රයන්ට ම සුවිශේෂී වූ හේතූන් මත බැංකු ණය ගෙවා ගැනීමේ අපහසුතාවන්ට පත්ව ඇති බවයි. ඔවුන් වෙනුවෙන් යම් සුවිශේෂ වැඩපිළිවෙළක් සකස් කිරීමේ අවශ්‍යතාව අමාත්‍යවරයා පෙන්වා දුන්නේ ය.

මෙහි දී අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා කියා සිටියේ පීඩාවට පත් සියලු කර්මාන්ත වෙත පොදුවේ රජය මගින් ලබා දුන් සහනවලට අමතරව මෙම සුවිශේෂී ගැටලුවට මුහුණ පා ඇති පාර්ශවයන් පිළිබඳ සලකා බැලිය යුතු බවයි. එක් එක් කර්මාන්තවල අමුද්‍රව්‍ය ලබා ගැනීම, නිෂ්පාදනය සහ අලෙවියට බලපානු ලබන තත්ත්වයන් එකිනෙකට වෙනස් වන බැවින් මෙවැනි අවස්ථාවක ඔවුන්ට සහන සැලසීමේ දී ඒ ඒ ක්ෂේත්‍ර වෙත වෙන වෙනම අවධානය යොමු කරන ලෙස ද අග්‍රාමාත්‍යතුමා බලධාරීන්ට උපදෙස් ලබා දුන්නේ ය.

ණය ගෙවා ගත නොහැකි වීම හේතුවෙන් ඇතැම් කර්මාන්ත සතු දේපළ බැංකු මගින් වෙන්දේසි කිරීමට සූදානම් වන බව මෙම අවස්ථාවේ දී කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතා පෙන්වා දුන්නේ ය. ඔවුන් මෙම ගැටලුවට මුහුණ දී ඇත්තේ රට තුළ මතු වූ ගැටලුකාරී තත්ත්වයන්ගේ ප්‍රතිඵලයක් ලෙස බව පෙන්වා දුන් අමාත්‍යවරයා කියා සිටියේ එම කර්මාන්ත යළි ආරම්භ කිරීම වෙනුවෙන් සහය ලබා දීම රජය සතු වගකීමක් බවයි.

බැංකු මගින් දේපොළ වෙන්දේසි කිරීමේ ක්‍රමවේදය යම් සංශෝධනයකට ලක් කළ යුතු බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා මෙහි දී අවධාරණය කළේ ය. බැංකු සහ ණයකරුවන් යන දෙපාර්ශවය වෙනුවට මෙවැනි අවස්ථාවක මැදිහත්වීමක් කළ හැකි තුන් වැනි පාර්ශවයක අවශ්‍යතාව අග්‍රාමාත්‍යවරයා පෙන්වා දුන්නේ ය. එවැනි අවස්ථාවකට මැදිහත්වීම සඳහා නිසි බලතල සහිත ඔම්බුඩ්ස්මන්වරයකුගේ අවශ්‍යතාව අවධාරණය කළ මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ සඳහා අවශ්‍ය නීතිමය පසුබිම සකස් කරන ලෙස ද බලධාරීන්ට උපදෙස් ලබා දුන්නේ ය.

එසේම දේපොළ ඇපයට තබා ගෙන ණය නිකුත් කිරීමේ දී ණය ලබා ගන්නා පාර්ශවය විසින් ඇප ලෙස තබන්නේ ඔවුන් පදිංචි නිවස දැයි සොයා බැලිය යුතු බව රාජපක්ෂ මැතිතුමා පැවැසීය. කිසියම් හේතුවක් මත අදාළ නිවස වෙන්දේසි කිරීමට සිදු වුව හොත් බැංකුව සිය ගනුදෙනුව අවසන් කළ ද රටට තවත් නිවාස නොමැති පවුලක් ඉතිරි වන බවයි අග්‍රාමාත්‍යතුමා සඳහන් කළේ. එබැවින් සිය එක ම නිවස ඇපයට තබා ණය ලබා ගත හැකි ක්‍රමවේදය යම් සංශෝධනයකට ලක් කිරීමේ හැකියාව සොයා බලන ලෙස ද හෙතෙම බලධාරීන්ට උපදෙස් ලබා දුන්නේ ය.

භාණ්ඩාගාර ලේකම් එස්.ආර්. ආටිගල මහතා එහි දී කියා සිටියේ දැනට සිටින මූල්‍ය කටයුතු භාර ඔම්බුඩ්මන්වරයාගේ බලතල වැඩි කිරීමට අදාළ නීතිමය පසුබිම සකස් කළ යුතු බවයි. ඒ අනුව බැංකු පනත සංශෝධනය කිරීමට අදාළ පියවර ගන්නා බව හෙතෙම අවධාරණය කළේ ය.

රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් මහතා කියා සිටියේ මේ සඳහා කෙටිකාලීන සේම දීර්ඝ කාලීන වැඩපිළිවෙළක් ද අවශ්‍ය බවයි. මෙම ව්‍යාපාර බලගැන්වීම සඳහා යම් ප්‍රාග්ධනයක් යෙදවිය යුතු බව අමාත්‍යවරයා කියා සිටියේ ය.

අමාත්‍ය විමල් වීරවංශ, රාජ්‍ය අමාත්‍යවරුන් වන අජිත් නිවාඩ් කබ්රාල්, ශෙහාන් සේමසිංහ, භාණ්ඩාගාර ලේකම් එස්. ආර්. ආටිගල යන මහත්වරු සහ ශ්‍රී ලංකා මහ බැංකුව, මහජන බැංකුව, ලංකා බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඇතුළු ආයතන රැසක නියෝජිතයෝ ද මෙම අවස්ථාවට එක් වූහ.

අග්‍රාමාත්‍ය කාර්ය මණ්ඩල ප්‍රධානී යෝෂිත රාජපක්ෂ, මුදල් අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම් ගැමුණු කරුණාරත්න යන මහත්වරු ඇතුළු පිරිසක් ද ඊට එක් වූහ.

අසේල බණ්ඩාරනායක,
ගරු මුදල් අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්